**#mediaethicsSL #EnglishPress #lka #DailyNews #March28**

ජනමාධ්‍ය මගින් ප්‍රවෘත්තියක් හෝ විශේෂාංග ලිපියක් හරහා ඉදිරිපත් කෙරෙනා කරුණු කාරණාවන් නිරවද්‍ය විය යුතු බව පිළිගත් මාධ්‍ය ආචාර ධර්මයකි. ඒ සඳහා තම ලිපියේ ඇති කරුණු හා දත්ත නිල මූලාශ්‍රයන් හරහා තහවුරු කොට ගැනීම, මූලාශ්‍ර කිහිපයක් භාවිතයෙන් තහවුරු කර ගැනීම වැනි භාවිතාවන් මාධ්‍යවේදියෙකුට උපයෝගී කොට ගත හැකි බව අප විසින් මින් පෙරද පෙන්වා දී ඇත. එවැනි භාවිතාවක් නොමැති නිසාවෙන් සිදුවන්නේ නිරවද්‍යතාවයෙන් හීන දත්ත සහ කරුණු සමාජගත වීමයි. එයට උදාහරණයක් ලෙසින් ඩේලි නිව්ස් මගින් ඉදිරිපත් කොට ඇති මෙම ප්‍රවෘත්තිය ( https://goo.gl/YUjwG3 ) පෙන්වා දිය හැක. මෙහිදී කාන්තා ශ්‍රම බලකාය 2017 වසරේ තුන්වන කාර්තුව තුළදී 87% ක් දක්වා ඉහළ නැග ඇතැයි ඩේලි නිව්ස් මගින් පැවසෙයි. නමුත් ශ්‍රී ලංකා ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කොට ඇති නිල වාර්තාවන් හි සඳහන් වන්නේ, 2017 වසරේ තුන්වන කාර්තුව තුළදී කාන්තා ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතය 36.6% ක් වන බවයි. මෙම දත්තයන් සඳහා කිසිදු මූලාශ්‍රයක් ඩේලි නිව්ස් මගින් දක්වා නොතිබෙන බවද අවධානයට ලක් විය යුතු කරුණකි. මෙම සංඛ්‍යාවන් දෙක අතර පෙනෙන්නට ඇති සුවිශාල පරතරයම, නිරවද්‍යතාවය පිළිබඳ මාධ්‍ය ආචාර ධර්මය රැකීමේ වැදගත්කම සම්බන්ධයෙන් අවධාරණය කරනු ඇත.

එසේම ඩේලි නිව්ස් මගින්ම යම් කාලයකට පෙරදී කාන්තා ශ්‍රම බලකායේ වර්ධනය පිළිබඳව ඉදිරිපත් කළ වෙනත් ප්‍රවෘත්ති වාර්තාවක ( https://goo.gl/ciBjPq ), ඒ සම්බන්ධ සංඛ්‍යාලේඛනයන් නිවැරදිව සඳහන් වී තිබීමද මෙහිදී අවධානයට ගත යුතු කරුණකි. තමන් ඉදිරිපත් කරනා ප්‍රවෘත්තියක පදනම සකස් කොට දෙන දත්ත නිරවද්‍යතාව සම්බන්ධයෙන් නැවත නැවතත් පරීක්ෂාකාරී විය යුතු බවත්, සෑම දත්තයක්ම ලබාගන්නා මූලාශ්‍රයන්ද සඳහන් කළ යුතු බවත් යළි යළිත් අවධාරණය කිරීම සඳහා අප මෙය අවස්ථාව කොට ගනිමු.